118)

# දූරස්ථ ගුරු අධ්‍යාපන පාඨමාලාවල ක්‍රියාත්මක වන සිසු පැවරුම් මඟින් ගුරු සිසුන්ගේ අධ්‍යයන කාර්යයට ලබා දෙන දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ජාතික අධ්‍යාපන ආයතනයේ දූරස්ථ ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දූරස්ථ ගුරු අධ්‍යාපන පාඨමාලා ඇසුරෙනි.)

ශ්‍රී ලංකා කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන නිබන්ධන කෘතිය

එම්. ජේ. නන්දාවති.
(සමාජ අධ්‍යයන ඩිප්ලෝමා-
අධ්‍යාපනවේදී-දෙවන පෙළ ඉහළ)

1992 සැප්.21

CR

UCLIB
441237

LIBRARY

# සංක්ෂේපයෙන්

ප්‍රාථමික අධ්‍යාපනයට සියල්ලන් ඇතුලත් කර ගැනීමේ අපේක්ෂාව, සාධනය කර ගැනීම සඳහා සුදුසු හා අවම සුදුසුකම් සහිත ගුරුවරුන් යොදා ගැනීමට සිදුවී ඇති රටවල අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය සඳහා ගුරු පුහුණුව අත්‍යවශ්‍ය වී ඇත. මේ අනුව අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය සඳහා අවම පිරිවැය ප්‍රමාණයකින් ගුරුවරුන් උදෙසා වෘත්තීය පුහුණුවක් ලබා දීමට ලෝකයේ දියුණු රටවල් මෙන්ම නොදියුණු රටවල් ද අද දුරස්ථ අධ්‍යාපන ක්‍රමය යොදා ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ ද ගුරු පුහුණුව සඳහා 1983 සිට දුරස්ථ අධ්‍යාපන ක්‍රමය යොදා ගෙන ඇත. ගුරු පුහුණුව සඳහා යොදා ගෙන ඇති දුරස්ථ ගුරු අධ්‍යාපන පාඨමාලා, පූර්වයෙන් සැලසුම් කළ පාඨමාලා ද්‍රව්‍ය පදනම් කරගත් ස්වයං අධ්‍යයන පාඨමාලා වේ. මෙම පාඨමාලාවල ද්විමාර්ගික සන්නිවේදනයේ පදනම ලෙස, පැවැරුම ක්‍රියා කරන අතර එම පැවැරුම් සම්මුඛ ඉගෙනුම් ක්‍රමයේ දී ගුරු කාර්ය භාරයට දෙවැනි නොවන කාර්යයක් කොටසක් ඉටු කරයි. මේ අනුව විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය යොදා ගනිමින් එම පැවැරුම් මගින් ගුරු සිසුන්ගේ අධ්‍යයන කාර්යයට ලැබෙන දායකත්වය විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය.

මෙම පර්යේෂණය සඳහා පාඨමාලාවේ සේවාර්ථීන් වන පුහුණුව ලබන ගුරුවරුන්ගෙන් පාඨමාලා අවසන් කර අවසාන පරීක්ෂණයට සුදුසුකම් ලත් ගුරු පිරිසෙන් 315 දෙනකු ස්තරායන අහඹු ක්‍රමයට තෝරා ගන්නා ලදී. පැවැරුම් කටයුතුවල නියැලී සිටින සියලුම ගුරු උපදේශකවරුන් ද පර්යේෂණය සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමට යොදා ගත්හ.

පර්යේෂණය සඳහා තොරතුරු ලබාගත් ප්‍රධාන ක්‍රමශිල්ප ප්‍රශ්නාවලි වූ අතර ඊට අමතරව අවශ්‍ය අවස්ථාවල දී අවිධිමත් සාකච්ඡා හා ලිඛිත සටහන් ද ප්‍රයෝජනයට ගැනුණි.

පැවැරුමෙන් ඉටුකර ගැනීමට අපේක්ෂිත කාර්යයන් සකුළුදායක මට්ටමින් ඉටු වුවත් දුරස්ථ අධ්‍යාපන වැඩ සටහන් මෙහෙයවන්නන් අපේක්ෂා කරන ප්‍රමුඛතා මට්ටමින් එම කාර්යයන් ඉටු නොවේ. පැවැරුමෙන් ඉටුවන කාර්යයන් සලකන විට එය ඉගෙනුම් උපකරණයක් හෝ ඉගෙනීමට මග පෙන්වන ඉගෙනීම පෙළඹවීමක් ඇති කරන උපකරණයකට වඩා ඇගැයීම් උපකරණයක් ලෙස සලකන බව පෙනේ.

පැවැරුම් මඟින් ඉහළ මට්ටමක සේවයක් ඉටුවන බව සේවාර්ථීන් පිළිගත්ත ද ඇතැම් සේවාවන් අවම මට්ටමින් ඉටුවේ. මොඩියුලයන්හි ඇතුළත් පැවැරුම්වල ආකෘතිය , සැලසුම හා අන්තර්ගතය සතුටුදායක මට්ටමක නොපවතී.

පැවැරුම් සම්බන්ධව, ගුරු උපදේශකවරයාගේ ලිඛිත ප්‍රචාරාරු කාර්යභාරය සතුටුදායක මට්ටමින් ඉටු වුවත් ඇතැම් සුවිශේෂ වැදගත්කමක් ඇති කාර්යයන් ඔවුන් ඉටු කරන්නේ අවම මට්ටමිනි. ගුරු සිසුන් ඉතා පිරිපුන් උපදේශනාත්මක සටහන් අපේක්ෂා කරන අතර ගුරු උපදේශකවරුන් සතුටුදායක මට්ටමකින් එම සටහන් තබති. එම සටහන් පහසුවෙන් කියවිය හැකි පහසුවෙන් තේරුම්ගත හැකි වුවත් ඒවා එකාකාරී හා විස්තර රහිත සටහන් වේ. පැවැරුම් ක්‍රියාවලියේ දී ගුරු උපදේශකවරුන් මෙන්ම ගුරු සිසුන් ද ගැටලු හා දුෂ්කරතා රාශියකට මුහුණ දෙති. එසේම පැවැරුම් හා පැවැරුම් ලකුණු කිරීම පිළිබඳව ගුරු උපදේශකවරුන් මෙන්ම ගුරු සිසුන් තුළ ද ධනාත්මක ආකල්ප ඇත. පැවැරුම් මඟින් ගුරු සිසුන්ගේ අධ්‍යයන කාර්යයට උපරිම දායකත්වයක් ලබා ගැනීම සඳහා ගුරු උපදේශකවරුන් මෙන්ම ගුරු සිසුන් ද කරන යෝජනා රාශියකි.

පැවැරුම් මඟින් ගුරු සිසුන්ගේ අධ්‍යයන කාර්යයට උපරිම දායකත්වයක් ලබා දීමට නම් දුරස්ථ අධ්‍යාපන සංකල්පය හා පැවැරුමේ වැදගත්කම, උපදේශන සටහන්වල වැදගත්කම හා ලිඛිත සන්නිවේදනය ආදී කාර්යයන් පිළිබඳව උපදේශකවරුන් මෙන්ම ගුරු සිසුන් ද දැනුවත් කළ යුතු වේ. එමෙන් පැවැරුම් ක්‍රියාවලියේ දී ගුරු උපදේශකවරුන් මෙන්ම ගුරු සිසුන් ද මුහුණපාන ගැටලු හා දුෂ්කරතා අවම කළ යුතුය. මෙම කාර්යයන්හි ලා වැදගත් වන යෝජනා කීපයක් ද මෙහි ලා ඉදිරිපත් කර ඇත.